# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**ඉතිහාසය** **කාලය පැය දෙකයි.**

**නම / අංකය : ........................................................** **8 ශ්‍රේණිය**

**I කොටස**

*** ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

*** I කොටසේ එක් ප්‍රශ්නයකට ලකුණු දෙකක් හිමිවේ.**

(01) විශාල වැව් ඉදිකිරීමේ පුරෝගාමී රජු,
(i) පරාක්‍රමබාහු රජු (ii) මහසෙන් රජු
(iii) වසභ රජු (iv) දේවානම්පියතිස්ස රජු.

(02) රුවන්වැලි සෑය තැනවූ රජු,
(i) කාවන්තිස්ස රජු (ii) දුටු ගැමුණු රජු (iii) අභය රජු (iv) මහසෙන් රජු

(03) ශිව දේවාලය පිහිටා ඇත්තේ,
(i) පොළොන්නරුව (ii) අනුරාධපුරය (iii) දඹුල්ල (iv) ගම්පොළ

(04) අපේ රටේ වාරි තාක්ෂණය (වැව්) පිළිබඳව වැඩිපුරම සඳහන් වන්නේ,
(i) මහා වංශයේ (ii) දීපවංශයේ (iii) ථූපවංශයේ (iv) බෝධිවංශයේ

(05) ජයවාපී වැව ඉදිකරන ලද්දේ යැයි සැලකෙන්නේ කුමන රජු දවස
(i) මහාපරාක්‍රමබාහු රජු දවස (ii) පණ්ඩුකාභය රජු දවස
(iii) මහසෙන් රජු දවස (iv) ධාතුසේන රජු දවස

**● නිවැරදි පිළිතුර යා කරන්න.**

| | A | B |
|---|---|---|
| (06) | කළාවැව තැනවූ රජතුමා | R.L. බ්‍රෝහියර් |
| (07) | වැව් බැම්මේ ඇතුල්පැත්තේ ගල් අතුරා සකසා ඇත්තේ | සඳකඩ පහන |
| (08) | ආගමික ගොඩනැගිලි ඉදිරිපිට ඇති අඩසඳ හැඩැති ගල්පුවරුව | ධාතුසේන රජු |
| (09) | ලක්දිව පුරාතන වාරිමාර්ග කෘතිය | ජල්ලුරවාපි වැව |
| (10) | හුරුළු වැව | රළපනාව |

**● පහත ප්‍රකාශ හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද යොදන්න.**

(11) ගෝඨාභය රජු විසින් පද්මස්වර නමින් උයනක් තනවන ලදි. (.......)

(12) රජගල පැරණි ආරාම භූමියේ ගල්තලා ආශ්‍රිත පොකුණු වල පා දෝවන තනවා තිබුණි. (.......)

(13) පිළිමගෙවල් නිර්මාණයේ පැරණිම සම්ප්‍රදාය ගන්ධකුටි සම්ප්‍රදායයි. (.......)

(14) මැටි භාජන තැනීම මුලින්ම ආරම්භ කල මානවයන් ඒවා තැනීම සඳහා සකපෝරුව භාවිතා කළහ. (.......)

(15) ලංකාවේ මුලින්ම ඉදිවූ දාගැබ ථූපාරාමයයි. (.......)

- හිස්තැන් පුරවන්න.

(16) කලාවැවේ සිට තිසා වැවට ජලය ගෙනයෑමට .................................................. ඇළ තනවන ලදී.

(17) මහසෙන් රජතුමා මින්නේරිය වැවට ජලය ලබා ගැනීමට .......................................ඇළ තනවන ලදී.

(18) සීගිරි ජල මල් ....................................................ජල උද්‍යානයේ පිහිටා ඇත.

(19) මැටි බඳුන් තනා ගැනීමට ගන්නා උපකරණය ....................................................... නමින් හැඳින්වේ.

(20) දිවයිනේ මුල්වරට .....................................................රජු උයනක් තනවන ලදී.

(ලකුණු 20 x 2 = 40)

## II කොටස

**(01) පළමු ප්‍රශ්නය අනිවාර්යවේ. තවත් ප්‍රශ්න හතරක් තොරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

I.




වැවක දළ සැලැස්ම ඉහත සඳහන්වේ. ඉංග්‍රිස අකුරෙන් නම කර ඇති ස්ථාන නිවැරදිව සඳහන් කරන්න.

(ලකුණු 06)

II.

ඔබට සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

1) මන්නාරම
2) ත්‍රිකුණාමලය
3) ගාල්ල
4) කළුතර
5) කල්පිටිය
6) අම්පාර
7) අනුරාධපුරය
8) මඩකලපුව
9) පේදුරු තුඩුව
10) දඹකොළ පටුන
11) මහනුවර
12) කොළඹ

(ලකුණු 06)


B
A
C
D
E
F
H
G
I
J
K
L
උ

(02)

I. පණ්ඩුකාභය රජුගේ කාලයේ ඉදිවූ වැව් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

II. මහවැව් තැනවීම නිසා ලාංකිකයින් ලබාගත් ජයග්‍රහණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III.

(a) වැව් තැනවීමේදී මුහුණදුන් අභියෝග තුනක් සඳහන් එකක් විස්තර කරන්න.

නැතහොත්

(b)

(I). බිසෝකොටුව

(II). සොරොව්ව පිළිබඳ කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(03)

I. අමුණ හෙවත් වේල්ල යනු කුමක්ද? (ලකුණු 03)

II. වේලි වර්ග සඳහන් කර ඒවා තනවා ඇති ආකාරය පැහැදිළී කරන්න. (ලකුණු 04)

III. ඇළ මාර්ග තැනවීමේදී මුහුණදුන් අභියෝග දෙකක් සඳහන් කර එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04)

I. පොකුණු තැනීමේදී යොදාගන්නා විවිධ හැඩ මොනවාද? (ලකුණු 03)

II. පොකුණු වර්ග හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

III. අභයගිරි දාගැබට වැටෙන ජලය පොකුණකට ගලායන ආකාරය නම් කරන ලද දළ සැලැස්මකින් පෙන්වන්න. (ලකුණු 05)

(05)

I. මිහිඳු මාහිමි මෙම උයනේ සිට ධර්මය දේශනා කල නිසා ශාසනය බැබලවූ බව සඳහන් වේ. එම උයන හැඳින්වූ නම් දෙක ලියන්න. (ලකුණු 03)

II. උයන් තැනවූ රජවරුන් හතරදෙනෙක් නම් කරන්න. (ලකුණු 04)

III. උද්‍යාන වර්ග කර ඇති ආකාර දෙක සඳහන් කර ඒවාට උදාහරණ එක බැගින් ලියන්න. (ලකුණු 05)

(06)

I. පිළිම ගෙවල් නිර්මාණය කරන ප්‍රධාන සම්ප්‍රදායන් තුන සඳහන් කරන්න. (ලකුණු 03)

II. ආගමික ගොඩනැඟිලි හතරක් නම් කරන්න. (ලකුණු 04)

III. මැටි බඳුන් තැනීමේ තාක්ෂණය ක්‍රමයෙන් දියුණු වූ ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 05)

***